# සෞඛ්‍ය
# අමාත්‍යාංශයේ
# අතුරු වෛද්‍ය
# සේවාවට අයත්
# (MT-04)
# ඖෂධ සංයෝජක
# තනතුර සඳහා වන
# බඳවා ගැනීම්
# පරිපාටිය

# සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි
# අතුරු වෛද්‍ය සේවා ගණයේ (MT – 04)
# ඖෂධ සංයෝජක තනතුර සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : අදාළ නොවේ.

1.2 අමාත්‍යාංශය : සෞඛ්‍ය අමාත්‍යාංශය

යොමු අංකය : 07/A/D/06/2017 දිනය: 2019.09.15

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

| | |
|---|---|
| යොමු අංකය : DMS/0016/055 | දිනය: 2018.08.28 |
| යොමු අංකය : DMS/0016/008 | දිනය: 2018.08.30 |
| යොමු අංකය : DMS/0016/043 | දිනය: 2018.09.05 |
| යොමු අංකය : DMS/0016/015 | දිනය: 2018.09.07 |
| යොමු අංකය : DMS/0016/030 | දිනය: 2018.09.07 |
| යොමු අංකය : DMS/0016/026 | දිනය: 2018.09.12 |
| යොමු අංකය : DMS/0016/013 | දිනය: 2018.09.25 |
| යොමු අංකය : DMS/0016/014 | දිනය: 2018.09.25 |
| යොමු අංකය : DMS/0016/023 | දිනය: 2018.09.25 |
| යොමු අංකය : DMS/0016/017 | දිනය: 2018.09.26 |
| යොමු අංකය : DMS/0016/018 | දිනය: 2018.09.26 |
| යොමු අංකය : DMS/0016/016 | දිනය: 2018.10.03 |
| යොමු අංකය : DMS/0016/020 | දිනය: 2018.10.03 |
| යොමු අංකය : DMS/0016/111 | දිනය: 2018.10.04 |
| යොමු අංකය : DMS/0016/027 | දිනය: 2018.10.11 |
| යොමු අංකය : DMS/0016/028 | දිනය: 2018.10.11 |
| යොමු අංකය : DMS/0016/019 | දිනය: 2018.10.17 |
| යොමු අංකය : DMS/0016/022 | දිනය: 2018.10.18 |
| යොමු අංකය : DMS/0016/021 | දිනය: 2018.10.23 |
| යොමු අංකය : DMS/0016/024 | දිනය: 2018.10.26 |
| යොමු අංකය : DMS/0016/010 | දිනය: 2018.11.20 |
| යොමු අංකය : DMS/0016/031 | දිනය: 2018.11.20 |
| යොමු අංකය : DMS/0016/042 | දිනය: 2018.11.20 |
| යොමු අංකය : DMS/0016/029 | දිනය: 2018.11.23 |
| යොමු අංකය : DMS/0016/096 | දිනය: 2018.12.26 |
| යොමු අංකය : DMS/0016/054 | දිනය: 2019.01.03 |
| යොමු අංකය : DMS/0016/101 | දිනය: 2019.01.03 |
| යොමු අංකය : DMS/0016/102 | දිනය: 2019.01.03 |
| යොමු අංකය : DMS/0016/060 | දිනය: 2019.01.07 |
| යොමු අංකය : DMS/0016/100 | දිනය: 2019.01.07 |
| යොමු අංකය : DMS/0016/094 | දිනය: 2019.01.10 |
| යොමු අංකය : DMS/0016/103 | දිනය: 2019.01.10 |
| යොමු අංකය : DMS/0016/032 | දිනය: 2019.01.10 |
| යොමු අංකය : DMS/0016/057 | දිනය: 2019.01.29 |

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය

යොමු අංකය : EST-2/02/REC/0944 දිනය: 2019.01.23

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංකය : NSCC/4/13/SR/17 දිනය: 2018.11.12

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :

යොමු අංකය : PSC/EST/06-01-13/03/2019 දිනය: 2020.10.14

**02. පත් කිරීම් බලධරයා :**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

**03. සේවා ගණය පිළිබඳ විස්තර :**

**3.1 සේවා ගණය** : අතුරු වෛද්‍ය සේවා ඛණ්ඩ 03

**3.2 ශ්‍රේණි** : III, II, I හා අධි

**3.3** පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

සෞඛ්‍ය ආරක්ෂණ වෘත්තීය කාර්යයන් ඉටු කරන්නා වූ අතුරු වෛද්‍ය සේවාව සඳහා වූ තනතුරුවලට අදාළ විද්‍යාත්මක මූලධර්ම පදනම්ව තාක්ෂණ විද්‍යාත්මක කාර්යයන් ඉටු කිරීමෙන් ඖෂධ භාරකාරීත්වය හා පරිහරණය පිළිබඳ කාර්යයන් හි ඇතුළත් රෝගී සත්කාර සේවාව පරිපූර්ණ වීමට ඉවහල් වන්නාවූ සේවා ඉටු කිරීම සඳහා පත්කිරීමේ බලධරයා විසින් සුවිශේෂී කොට දක්වනු ලැබ ඇති කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**3.4** කාර්යයන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාවය පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය :** ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ. ( විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.)

**05.** වැටුප්

**5.1** වැටුප් කේත අංකය : MT - 4- 2016

**5.2** වැටුප් පරිමාණය (මාසික) : රු. 31,190 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - 57,700.00

**5.3** ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 01 | 31, 190 |
| II | පියවර 12 | 36, 300 |
| I | පියවර 23 | 43, 630 |
| අධි ශ්‍රේණිය | පියවර 32 | 50, 200 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්: ( ඇමුණුම - 01)

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

- ඖෂධ සංයෝජක - 129

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සලකනු ලැබේ.

07. බඳවා ගැනීම් ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම් :

| අනු අංකය | තනතුර | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 01 | ඖෂධ සංයෝජක | 1. (අ) සිංහල භාෂාව / දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම.<br>සහ<br>(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් දෙකක් එක වරකදී සමත් වීම.<br>සහ<br>(ඇ) සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය මඟින් මෙහෙයවනු ලබන ඖෂධ සංයෝජක එක් අවුරුදු පූර්ණකාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම. |

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සිසු පුහුණුව සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය පළ කරන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් (වෘත්තීය සුදුසුකම් හැර අනෙකුත් සුදුසුකම්) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අවුරුදු 18

7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 30

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

(අ) පුහුණුවට බඳවා ගැනීම

පුහුණුව සඳහා බඳවා ගනු ලබන සංඛ්‍යාව, සලකා බලනු ලබන වර්ෂයේ අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජෛව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව එක් එක් විෂය ධාරාවෙන් ඉහළම Z අගය ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

වර්ෂ දෙකක් හෝ ඊට වැඩි වර්ෂ ගණනක අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල මත පුහුණුව සඳහා බඳවාගනු ලබන්නේ නම්, සලකා බලනු ලබන වර්ෂවල අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජෛව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවන්ගෙන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටින මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවට හා එක් එක් පළාත් අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා එක් එක් විෂය ධාරාවෙන් ඉහලම Z අගය ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් පළාත් පදනමින් තෝරා ගනු ලැබේ.

සටහන:

1. අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් මත පුහුණුව සඳහා අයදුම්පත් කැඳවන වර්ෂයන් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.
2. රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ පළ කිරීම මඟින් පුහුණුව සඳහා සිසු නිලධාරීන් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.
3. පුහුණුවට බඳවා ගනු ලබන සිසුන්ගේ සංඛ්‍යාව අනුව ඉහළම Z අගය ලබාගන්නා අයදුම්කරුවන්ගෙන් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් ප්‍රමාණයක් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයකට කැඳවනු ලබන අතර ඔවුන්ගේ අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් එම සම්මුඛ පරීක්ෂණයේදී සිදු කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ.)

පුහුණුවට බඳවා ගැනීමට අදාල කොන්දේසි

i. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය. තමන් අයදුම් කරන පළාත තුළ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු දිනට පූර්වාසන්න අවුරුදු තුනක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතුය.
ii. පුහුණුවට බඳවා ගනු ලබන දිනට විශ්වවිද්‍යාල හෝ වෙනත් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී නොසිටිය යුතුය.

iii. පුහුණුව සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට සඳහන් කරනු ලබන දිනට සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය.

(ආ) III වන ශ්‍රේණියට බඳවා ගැනීම

ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරනු ලබන සිසු නිලධාරීන්ගේ කුසලතා අනුපිළිවෙළ, පුහුණුවට බඳවා ගැනීමේදී සලකා බලනු ලැබූ පළාත හා තනතුරේ පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

**7.2.4.1** ලිඛිත විභාගය: අදාළ නොවේ

**7.2.4.2** වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ

**7.2.4.3** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: (ලකුණු ලබා දෙනු නොලැබේ.)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් පරීක්ෂා කිරීම

**7.2.4.3.1** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා:

සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

**7.2.4.4** යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය: අදාළ නොවේ

**7.2.5** අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :

රජයේ ගැසට් පත්‍රයේ පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම: අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

8. කාර්යක්ෂමතා කඩඉම් :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණ / සහතික පාඨමාලාව / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගතවීමට පෙර | ලිඛිත, වාචික සහ ප්‍රායෝගික පරීක්ෂණයකි |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි |

(එක් එක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට අදාල විෂය නිර්දේශයන් ඇමුණුම 02 I, 02 II, 02 III හි සඳහන් වේ.)

**8.2** කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වර්ෂයකට දෙවරක්

**8.3** කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද:

1 වන කාර්යක්ෂමතා කඩඉම - : සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

2 වන කාර්යක්ෂමතා කඩඉම - :සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

3 වන කාර්යක්ෂමතා කඩඉම - :සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්

**8.4**

(අ) කාර්යක්ෂමතා කඩඉම් විභාගය

| එක් එක් බඳවා ගැනීම් පටිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් | |
|---|---|
| පැරණි බඳවාගැනීම් පරිපාටිය | නව බඳවාගැනීම් පරිපාටිය |
| (1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>➤ I කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති<br>• මුදල් රෙගුලාසි<br>➤ පළමු දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂයානුබද්ධ<br>• ප්‍රායෝගික | (1) I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |
| (2) II කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>➤ II කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි<br>➤ දෙවන දෙපාර්තමේන්තු පරීක්ෂණය<br>• විෂයානුබද්ධ →<br>• ප්‍රායෝගික | (2) II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති<br>• මුදල් රෙගුලාසි<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික) |
| (3) III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය<br>කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව | (3) III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(ආ) පෙර පැවති ඖෂධ සංයෝජක තනතුරට අදාලව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි යන විෂයයන් සමත් නිලධාරීන් මෙම බඳවාගැනීම් පටිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. එමෙන්ම එක් විෂයයක් පමණක් සමත් වී ඇත්නම් එම විෂයය නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් සේ සලකනු ලබන අතර ඉතිරි විෂයය නව බඳවාගැනීම් පරිපාටිය යටතේ සමත් වීමෙන් පසු පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කළ බවට සැලකේ.

(ඇ) මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති ඖෂධ සංයෝජක තනතුරට අදාළව සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටියෙහි සඳහන් විධිවිධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන්, පැවති බඳවා ගැනීම් පරිපාටියට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයයන්ට අනුරූපී වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතුය. අනුරූපී විෂයයන් ඉහත සඳහන් වගුවෙහි දැක්වේ.

පැරණි බඳවා ගැනීම් පරිපාටි අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපී විෂයන් සමත් වී ඇත්නම් එම විෂයයන් පමණක් නව බඳවා ගැනීම් පරිපාටිය යටතේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

එමෙන්ම පෙර පැවති බඳවා ගැනීම් පරිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පූර්ණ වශයෙන් සමත් නිලධාරීන් මෙම බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් විය යුතු දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ඈ) නව බඳවා ගැනීම් පරිපාටිය බලාත්මක වන දිනට I ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන් වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එමෙන්ම පෙර පැවති ඖෂධ සංයෝජක තනතුරට අදාළ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් අධීක්ෂණ කළමනාකරණ තාක්ෂණික නොවන/ තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පරිපාටිය අනුව සහ අංක 1930/12 හා 2015.09.01 දිනැති ගැසට් පත්‍රයෙහි පළ කරන ලද ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ලෙසින් වන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව සම්පූර්ණ කරන ලද නිලධාරීන්, මෙම නව බඳවා ගැනීම් පරිපාටිය අනුව සමත් විය යුතු තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) කෙසේ වෙතත් අදාළ පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුවද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළ කාලසීමාව වෙනස් නොවේ.

## 09. භාෂා ප්‍රවීණතාව

### 9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය. |
| 02 අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුයි. |

## 10. ශ්‍රේණි උසස් කිරීම්

### 10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

#### 10.1.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :

**10.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම්**

i. පත්වීම ස්ථිර කර තිබීම

ii. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම
iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම
vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

**10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.2 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

**10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :**

**10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම්**

i. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම
ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

**10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

**10.3 I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම**

**10.3.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව :**

**10.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්**

i. සේවා ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක දහය (10) ක් උපයාගෙන තිබීම

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

**10.3.1.2 උසස් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කරනු ලැබේ.

සංලක්ෂය

1. සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.
2. උසස් කිරීම්වලදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අදාළ වේ.

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි : අදාළ නොවේ

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම බඳවා ගැනීම් පටිපාටිය අනුමත කළ දිනට සේවයේ යෙදී සිටින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT - 04-2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන ඖෂධ සංයෝජක තනතුරේ නිලධාරීන් ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත පරිදි සිදු කරනු ලැබේ.

අන්තර්ග්‍රහණය හේතුවෙන් නිලධාරියාගේ වැටුප් වර්ධක දිනයෙහි හෝ ජ්‍යෙෂ්ඨතාවයේ වෙනසක් සිදු නොවිය යුතු අතර වැටුප් පරිවර්තනයේදී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 : 4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම සිදු නොකළ යුතුය.

**14.1. III ශ්‍රේණිය**

2016.10.11 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සිටි සහ මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට වසර 6 කට අඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

### 14.2. II ශ්‍රේණිය

(අ) 2016.10.11 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ සිටි සහ මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට වසර 6 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ 10.1.1.1 හි අනු අංක i, iv, v සහ vi හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සහ

(ආ) 2016.10.11 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ සිටි නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සටහන

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරීන්ගේ මුළු සේවා කාලයෙන් වසර 06 කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා II ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සේ සලකනු ලැබේ. (II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරියකු ඖෂධ සංයෝජක තනතුරට බඳවාගනු ලැබූ දිනයේ සිට අතුරු වෛද්‍ය සේවා ගණයේ තනතුරකට බඳවා ගනු ලැබූ යැයි කල්පිතව සලකා වැටුප සකස් කරනු ලබන අතර ඒ අනුව හිමිවිය යුතු වැටුපට වැඩි වැටුපක් නිලධාරියා අන්තර්ග්‍රහණය වන දිනට ලබන්නේ නම්, යටත් පිරිසෙයින් අදාළ වැටුප සමාන වන තුරු නිලධාරියාට දැනට ලබන වැටුප ගෙවනු ලැබේ.)

### 14.3. I ශ්‍රේණිය

(අ) 2016.10.11 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිටි නිලධාරීන් සහ

(ආ) 2016.10.11 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II ශ්‍රේණියේ සිටි සහ මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට II ශ්‍රේණියේ වසර 9කට නොඅඩු සේවා කාලයක්ද සහිතව වසර 15 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.2.1.1 හි අනු අංක iii සහ iv හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

සටහන

මෙම නිලධාරීන් බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට සම්පූර්ණ කර ඇති II ශ්‍රේණියේ වසර 09 කට නොඅඩු සේවා කාලයක් වසර 15 ට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා I ශ්‍රේණියේ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු ලැබේ. (I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන නිලධාරියකු ඖෂධ සංයෝජක තනතුරට බඳවාගනු ලැබූ දිනයේ සිට අතුරු වෛද්‍ය සේවා ගණයේ තනතුරකට බඳවා ගනු ලැබූ යැයි කල්පිතව සලකා වැටුප සකස් කරනු ලබන අතර ඒ අනුව හිමිවිය යුතු වැටුපට වැඩි වැටුපක් නිලධාරියා අන්තර්ග්‍රහණය වන දිනට ලබන්නේ නම්, යටත් පිරිසෙයින් අදාළ වැටුප සමාන වන තුරු නිලධාරියාට දැනට ලබන වැටුප ගෙවනු ලැබේ.)

### 14.4. අධි ශ්‍රේණිය

2016.10.11 දින ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ සිටි සහ මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට I ශ්‍රේණියේ වසර 10 කට නොඅඩු සේවා කාලයක්ද සහිතව වසර 25 කට වඩා වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**15.** සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

**16.** මෙම බඳවා ගැනීම් පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන :

2020.12.31 දින දක්වා අන්තර්කාලය ක්‍රියාත්මක වේ. මෙම අන්තර් කාලය තුළ II ශ්‍රේණියේ හා I ශ්‍රේණියේ උසස්වීම් පහත පරිදි ලබා දෙනු ඇත.

**17.1. II ශ්‍රේණියට උසස් කිරීම**

III ශ්‍රේණියේ වසර 06 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.1.1.1 හි අනු අංක i, iv, v සහ vi හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ඇත.

**17.2. I ශ්‍රේණියට උසස් කිරීම**

II ශ්‍රේණියේ වසර 09 කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.2.1.1 හි අනු අංක iii සහ iv හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ඇත.

**17.3.** මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනය වන විට සේවයේ සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 7 වැනි වගන්තිය යටතේ විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමේ වරප්‍රසාදය පිරිනැමිය යුතු තරමට මෙහි ඇතුළත් විධිවිධාන වලින් අහිතකර බලපෑමක් ඇති වී ඇතැයි රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත් වන්නේ නම් මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කරන දින සිට වසරක් ඇතුළත එම මනාපය ප්‍රයෝජනයට ගැනීමට යටත්ව නිලධාරියෙකු ඉල්ලීමක් කළහොත් එසේ විශ්‍රාම ගැනීමට ඉඩ දෙනු ඇත.

සකස් කළේ :

අත්සන :- ..............................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම - : එල්.එල්.සී.ලොකුගේ
තනතුර - : අධ්‍යක්ෂ (පාලන)VII

දිනය - : 2020.11.13

පරීක්ෂා කළේ :

අත්සන :- ..............................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම - : සිරිමල් ලොකුගමගේ
තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I

දිනය - : 2020.11.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන ..............................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම - වෛද්‍ය අසේල ගුණවර්ධන
තනතුර - : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය - : 2020.11.17

නිල මුද්‍රාව - වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

යොමු අංකය - 07/A/D/06/2017

සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් ඖෂධ සංයෝජක තනතුර සඳහා 2020.10.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ............................................................

වෛද්‍ය එස්.එච්.මුණසිංහ

ලේකම්

සෞඛ්‍ය අමාත්‍යාංශය

දිනය - : 2020/11/20

නිල මුද්‍රාව - : වෛද්‍ය එස්. එච්. මුණසිංහ
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

---

යොමු අංකය - PSC/EST/06-01-13/03/2019

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතුරු වෛද්‍ය සේවාවට අයත් ඖෂධ සංයෝජක තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2020.10.13 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන ............................................................

නම - : එම්. ඒ. සී. දයා සෙනරත්

ලේකම්,

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය - : 2020.12.04

නිල මුද්‍රාව - එම්. ඒ. සී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම - 01

**සේවා ගණයට අයත් තනතුර/ තනතුරු :**

**අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :**

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | තනතුර අනුමත ශ්‍රේණිය | කාර්යයන් |
|---|---|---|---|
| ඖෂධ සංයෝජක | 129 | III සහ II ශ්‍රේණි | (අ)<br>• වෛද්‍ය නිලධාරි විසින් නිර්දේශිත ඖෂධ වට්ටෝරුවල ඇතුළත් සියලුම ඖෂධ වර්ග රෝගීන් සඳහා නිකුත් කිරීම හා රෝගීන්ට ඖෂධ පිළිබඳ නිසි උපදෙස් ලබා දීම<br>• රෝගීන් සඳහා අවශ්‍ය අභ්‍යන්තරික සංයෝජන හා බාහිර ආලේපන වර්ග අදාළ ප්‍රමිතීන්ට අනුව සකස් කර නිකුත් කිරීම<br>• ඖෂධ වට්ටෝරු අනුව ඇස්, කන්, නාසය සඳහා වූ දියර සහ බින්දු වර්ග ආදිය ඖෂධ ප්‍රමිතීන්ට අනුව නිකුත් කිරීම<br>• නිවැරදි ප්‍රමිතීන්ට අනුකූලව සාන්ද්‍රණගත විෂබීජ නාශක දියර ආදිය සකස් කර රෝහලේ වාට්ටු සැරහුම් කාමර, ශල්‍ය කාමර ආදී අනෙකුත් අංශ වෙත නිකුත් කිරීම<br>• ඖෂධ, ශල්‍ය ද්‍රව්‍ය, සැරහුම් ද්‍රව්‍ය, උපකරණ, වාට්ටු, සැරහුම් කාමර, ශල්‍ය කාමර හා අනෙකුත් අංශ වෙත නිකුත් කිරීම<br>• සුවඳ විලවුන් හා ඖෂධ පනතේ 3 වන උපලේඛනයේ සඳහන් අන්තරායකර ඖෂධ ගබඩා කිරීමේ හා පරිහරණය කිරීමේ කටයුතු අවශ්‍ය පරිදි සිදු කිරීම<br>• ඖෂධ, ශල්‍ය හා සැරහුම් ද්‍රව්‍ය ලබා ගැනීම හා නිකුත් කිරීමේ ලේඛන දෛනිකව පවත්වාගෙන යාම හා එම ද්‍රව්‍යයන්හි තොග පිළිබඳව වගකීම ඍජු ලෙස දැරීම<br>• ඖෂධ තොගවල ගබඩාකරණය පිළිබඳ ඍජු වගකීම දැරීම, ගබඩා තත්ත්වයන් නිසි ලෙස පවත්වා ගෙන යාම හා එය දෛනිකව අධීක්ෂණය කිරීම<br>• ආයතනයේ වාර්ෂික ඖෂධ, ශල්‍ය හා සැරහුම් ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා ආයතන ප්‍රධානියාට සහාය වීම<br>• ආයතනික ඖෂධ සමාලෝචන කමිටුව සඳහා සාමාජිකයෙකු ලෙස පත් කළහොත් සහභාගී වීම හා එහිදී අදාළ සංඛ්‍යා ලේඛන දත්ත සැපයීම, ඒවා නිසි ලෙස පවත්වා ගෙන යාම<br>• ඖෂධ පරිහරණ කටයුතු සඳහා ඍජු ලෙස අදාළ මණ්ඩල වෙත සහාය ලබා දීම හා කල්ඉකුත් වූ |

| | | | |
|---|---|---|---|
| | | | ඖෂධ පරිහරණය, අවම ඖෂධ, කල්ඉකුත් වීමට ආසන්න ඖෂධ පිළිබඳව වාර්තා අදාළ අංශ වෙත නිවැරදිව සැපයීම<br>• ඖෂධ ශාලාවේ සාමාන්‍ය හා ශල්‍ය වට්ටෝරුගත ලේඛන නිසි ලෙස පවත්වා ගෙන යාම, තොග භාණ්ඩ සමීක්ෂණ කටයුතු වලදී අදාළ මණ්ඩල වෙත ඒ සඳහා සහයෝගය ලබා දීම<br>• රෝගීන්ට ඖෂධ භාවිතය, ඖෂධවල අතුරු ප්‍රතිඵල ආදී කරුණු පිළිබඳව දැනුම ලබා දීම. |
| | | ------- | ---------- |
| | | I<br>සහ<br>අධි<br>ශ්‍රේණිය | (ආ)<br>ඉහත (අ) හි සඳහන් කාර්යයන්ට අමතරව ඉහත නිලධාරීන්ට අදාල කාර්යයන් අධීක්ෂණය කිරීම, පුහුණු සිසුන් අධීක්ෂණය, විභාග සඳහා දායකත්වය ලබා දීම හා අවශ්‍ය විටකදී අංශ පරිපාලනය පිළිබඳ වගකීම දැරීම |

සකස් කළේ :

අත්සන :- ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම - : එල්.එල්.සී.ලොකුගේ

තනතුර - : අධ්‍යක්ෂ (පාලන) VII

දිනය - : 2020.11.13

පරීක්ෂා කළේ :

අත්සන :- ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම - : සිරිමල් ලොකුගමගේ

තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I

දිනය - : 2020.11.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම - : වෛද්‍ය අසේල ගුණවර්ධන

තනතුර - : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය - : 2020/11/17

නිල මුද්‍රාව - : වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

ඇමුණුම - 02

<u>ඇමුණුම 2 – I</u>

අමාත්‍යාංශය - සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය

සේවා ගණය - අතුරු වෛද්‍ය සේවය

01. විභාගයේ නම - අතුරු වෛද්‍ය සේවයේ III ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. විභාගය පිළිබඳ විස්තර -

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 3 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 3 | 100 | 40% |

03. විභාගය පවත්වනු ලබන බලධරයා :

සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

05. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති මත මෙම ප්‍රශ්න පත්‍රය සැකසේ.<br>ආයතන සංග්‍රහයේ පරිච්ඡේද<br>IV,XII,XIII,XIV,XIX,XLVII,XLVIII |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය පහත සඳහන් මුදල් රෙගුලාසි මත සැකසේ.<br>I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ඒකාබද්ධ අරමුදල, වාර්ෂික ඇස්තමේන්තු, වාර්ෂික ඇස්තමේන්තු වෙනස් කිරීම (මුදල් රෙගුලාසි 1 – 68 දක්වා)<br>II වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය හා උත්තරදායී බව, ප්‍රධාන ගණක නිලධාරි, ගණක නිල ආදායම් ගිණුම් නිලධාරීන්, ගෙවීම් සඳහා බලය ලබා දීම, අනුමත කිරීම, සහතික කිරීම, කාර්ය පැවරීම ( මුදල් රෙගුලාසි 124 සිට 147 දක්වා) |

සකස් කළේ :

අත්සන :- ......................................

(විෂය භාර කණිෂ්ය මාණ්ඩලික නිලධාරියා)

නම - : එල්.එල්.සී.ලොකුගේ

තනතුර - : අධ්‍යක්ෂ (පාලන)VII

දිනය - : 2020.11.13

පරීක්ෂා කළේ :

අත්සන :- ......................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම - : සිරිමල් ලොකුගමගේ

තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I

දිනය - : 2020.11.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන ......................................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම - : වෛද්‍ය අසේල ගුණවර්ධන

තනතුර - : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

නිල මුද්‍රාව - : වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

දිනය - : 2020/11/17

## ඇමුණුම 2 – II

අමාත්‍යාංශය : සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශය

සේවා ගණය : අතුරු වෛද්‍ය සේවය

**01.** විභාගයේ නම : අතුරු වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

**02.** විභාගය පිළිබඳ විස්තරය :

(අ) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | පැය 2 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 2 | 100 | 40% |

(ආ) විෂයානුබද්ධ පරීක්ෂණය :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ ලිඛිත | පැය 3 | 100 | 40% |
| විෂයානුබද්ධ වාචික | විනාඩි 15 | 100 | 40% |
| විෂයානුබද්ධ ප්‍රායෝගික | පරීක්ෂණය අනුව | 100 | 40% |

**03.** විභාගය පවත්වනු ලබන බලධරයා :
සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**04.** විභාගය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග : වසරකට දෙවරක්

**05.** විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය | ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත ප්‍රශ්න පත්‍රය සැකසේ. ආයතන සංග්‍රහයේ පරිච්ඡේද XV, XVI, XXIII, XXIV, XXV, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII |

| | |
|---|---|
| මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br>(1). VI වන පරිච්ඡේදය-<br>ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකත්වය, අග්‍රිමය හා බැංකු ගිණුම්, රාජ්‍ය මුල්‍ය සුරක්ෂිතභාවය, සමීක්ෂණ මණ්ඩල, අයිරාව බැංකු ගිණුම ( මුදල් රෙගුලාසි 315 සිට 396 දක්වා )<br>( 2 ). XIII වන පරිච්ඡේදය-<br>සැපයුම් වැඩ හා සේවා : සැපයීම්/ මිළට ගැනීමේ ක්‍රියාවලිය, ගබඩා සමීක්ෂණ, ගබඩාකරණ ක්‍රියාවලිය, කොන්ත්‍රාත්, ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරවීම.<br>( මුදල් රෙගුලාසි 708 සිට 775 දක්වා ) |
| විෂයානුබද්ධ පරීක්ෂණය- ලිඛිත විභාගය | ඩිප්ලෝමා පුහුණු පාඨමාලාවේ විෂය නිර්දේශයට අදාලව හා රාජකාරි මාලාවට අනුරූපී වන<br>I. ඖෂධවේදයට අදාල සිද්ධාන්ත හා තාක්ෂණික දැනුම<br>II. ඖෂධ සංයෝජනය/ මිශ්‍ර කිරීමට අදාල සිද්ධාන්ත හා ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම<br>III. ඖෂධ කළමනාකරණයට අදාළ සිද්ධාන්ත හා නෛතික දැනුම (ඖෂධ ඇණවුම් කිරීම, ගබඩා කිරීම, ගබඩා පාලනය, ඖෂධ අපහරණය ආදී ) |
| විෂයානුබද්ධ පරීක්ෂණය වාචික පරීක්ෂණය | විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට අදාළ විෂය නිර්දේශයට අදාළව හා සේවයේ යෙදීමේදී එළඹිය හැකි ගැටලු පිළිබඳ වාචික පරීක්ෂණයකි. |
| විෂයානුබද්ධ පරීක්ෂණය ප්‍රායෝගික පරීක්ෂණය | විෂය ක්ෂේත්‍රයට අදාලව හැකියාවන්, ක්‍රියාකාරකම් හා බැඳුනු ප්‍රායෝගික පරීක්ෂණයකි. විෂයානුබද්ධ ලිඛිත පරීක්ෂණයට අදාළ වන විෂය නිර්දේශය මෙයටද අදාළ වේ. |

සකස් කළේ :

අත්සන :- ........................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : එල්.එල්.සී.ලොකුගේ
තනතුර - : අධ්‍යක්ෂ (පාලන)VII
දිනය - : 2020.11.13

පරීක්ෂා කළේ :

අත්සන :- ........................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)
නම - : සිරිමල් ලොකුගමගේ
තනතුර - : නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන)I
දිනය - : 2020.11.17

නිර්දේශ කර ඉදිරිපත් කරමි

අත්සන ........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම - : වෛද්‍ය අසේල ගුණවර්ධන
තනතුර - : සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

දිනය - : 2020/11/17

නිල මුද්‍රාව - : වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.